# කාව්‍යය සමාරම්භයඃ භාරතීය හා බෞද්ධ මතවාද සමාලෝචනය

ඇහැලේපොල මහින්ද හිමි

## ප්‍රවේශය

මානවයා සතු සෞන්දර්යාත්මක සහ නිර්මාණාත්මක චින්තාවලිය හා ඒ සමග බැඳුණු ඥාන සම්ප්‍රදාය ද කාව්‍ය යනුවෙන් සැලකේ. ගීතය සහ කවිය ශබ්ද රසයේත් අර්ථ රසයේත් සංකලනයෙකි. ගීතය කවියෙහි ම අනුකොටසකි. කාව්‍ය සංකල්පය මානවයාගේ ආදිතම අවස්ථාවේ සිට පැවත එන්නකි. කිසියම් ආගමකට, ජාතියකට, ප්‍රදේශයකට, භාෂාවකට හා කුලයකට සීමා නොවන සමස්ත මානව ප්‍රජාව මෙන්ම ඇතැම් සත්ත්ව කොටස් ද කාව්‍යයට සංවේදී වන නිසා කාව්‍ය යනු විශ්ව සාධාරණ වින්දනීය අත්දැකීමක් සේ ගිණිය හැකිය. විරාගී චින්තනය සහ චරණය මඟින් සංසාර විමුක්තිය සාක්ෂාත් කරගැනීමට මඟ පෙන්වන දර්ශනයක් වන බුදුදහමෙහි ඇතුළත් කාව්‍යයෙහි සමාරම්භය පිළිබඳ විග්‍රහය මෙහිදී සංක්ෂිප්ත ව විමර්ශනය කෙරේ. භාරතීය කාව්‍යවිචාර ධාරාව තුළ කාව්‍ය සංකල්පය මූලික ව හඳුන්වා දී ඇති ආකාරය සහ පිටකාගත කාව්‍ය සංකල්පනා පිළිබඳ ව මෙහි දී වැඩිදුරටත් සාකච්ඡා කර ඇත. කාව්‍යකරණය පෙර නොවූවිරූ නොදුටුවිරූ අපූරු වස්තු ප්‍රතිනිර්මාණය කිරීමේ විශ්ව ශක්තියක් බඳු ය. සැම පුද්ගලයෙකුට ම කවීත්ත්වය පිහිටන දෙයක් නො වේ. සඵලවත් සහ ගුණාත්මක කාව්‍යයක් නිර්මාණය කිරීම සඳහා නිර්මාණකරුවා සතු විය යුතු ධර්මතා කාව්‍ය සම්පත්තිය සේ ගැණෙන අතර ගුණාත්මක කාව්‍යයකින් අභිමත ආස්වාදයේ හරය කාව්‍යයේ අභිමතාර්ථය වේ. කාව්‍යය යනු සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි ලා ජනප්‍රියතම සාහිත්‍යාංගය යි. භාරතීය කාව්‍යවිචාරයෙහි පුළුල් පරාසයක විහිදුණු කාව්‍ය ප්‍රභේද ඇති අතර බෞද්ධ කාව්‍ය සම්ප්‍රදායෙහි ශ්‍රව්‍ය කාව්‍ය පිළිබඳ ව පමණක් සාකච්ඡා කර ඇත.

**කාව්‍යය සමාරම්භය : භාරතීය මතය**

ජීවන විනෝදය සහ ජීවන අවබෝධය ලබා දෙන කලාවේ උත්කෘෂ්ට ම අංගය වශයෙන් "කාව්‍යය" හැඳින්වීම යෝග්‍ය ය. කාව්‍ය යන්නට නිශ්චිත අර්ථ විග්‍රහයක් ඉදිරිපත් කිරීම අසීරු කටයුත්තකි. කිසියම් කෙනෙක්, දෙයක්, සිද්ධියක් වර්ණනා කිරීම යන අර්ථයෙන් කාව්‍ය යන වචනය සැකසී ඇත.[1] මිනිස් සිතෙහි අභ්‍යන්තරය ස්පර්ශ කරවන හෘදයේ සිදුරු අතුරින් ගලායන ප්‍රීතියේ අවසාන අවස්ථාව කරා ගමන් කරවන යමක් වේ නම් එය කාව්‍යය යි.[2] බටහිර සාහිත්‍යවේදීන් ද හෘද්ගතභාවයන් විදහා පෑමේ භාෂාව වශයෙන් කාව්‍ය හඳුන්වා ඇත.[3] රසය කෙනෙකුගෙන් කෙනෙකුට වෙනස්ව ජනිත වන දෙයකි. වර්ණය, සංගීතය සහ නර්තනය ද එලෙස ය. එබැවින් කාව්‍ය යන්න ද කෙනෙකුගෙන් කෙනෙකුට ගෝචර වන සහ තත් අන්තර්ගත රසය ජනිත වන ආකාරය අනුව කාව්‍ය පිළිබඳ ව පෙර-අපර දෙදිග බොහෝ මතවාද නිර්මාණය වී ඇත. ''රසය ආත්මය කොට ගත් වැකිය කාව්‍ය වේ'',[4] ''එක්තැන් වූ අර්ථයත් ශබ්දයත් කාව්‍යය වේ''[5] ආදි වශයෙන් කාව්‍යය යන්නෙහි අර්ථය, සංකල්පමය වශයෙන් කලින්කලට බිහි වූ පෙරදිග කාව්‍යවිචාරවාදයන්හි දී නිර්වචනය වී ඇත. මේ අනුව රමණීය අර්ථ සහ ශබ්ද ආදියෙන් මනසෙහි රසය ජනනය කරවන නිර්මාණාත්මක කියැවීම හෝ ලියැවීම කාව්‍යය සේ අර්ථකථනය කළ හැකිය.

කවිය කියවා රස විඳිය හැකි වන අතර ගීතය ද අසා රස විඳිය හැකිය. දෙවියන්ට කන්නලව් කිරීම සඳහා ද දෙවියන්ට සමීප වීම සඳහා ද සංගීතය යොදා ගැනීම බ්‍රාහ්මණ සමාජයෙහි ප්‍රධාන සිරිතක් විය. එපමණක් නොව නැටුම්, ගැයුම් හා වැයුම් යන මේ අංශ මිනිසා ප්‍රබෝධවත් කිරීම සඳහා මහාබ්‍රහ්මයා විසින් ලබා දෙන ලද පරිවාර වේදයක් ලෙස සැලකීමට එකල මනුෂ්‍යයෝ පුරුදුව සිටියහ.[6] සෑම ජීවී-අජීවී වස්තුවක ම සම්භවය දෙවියන් වෙත ආරෝපණය කිරීම පෙර-අපර දෙදිග ම මානවයා සතු ව පැවති පැරණි සිරිතකි. එහෙත් සාහිත්‍යය සංගීතය කාව්‍යය යනු කලාව නමැති පුළුල් වූ සෞන්දර්යාත්මක සංකල්පයෙහි උපසංකල්ප වන අතර ඒවා උපදින්නේ දෙවියන් අතර නොව ආදිකාලීන ගැමියන් අතර ය.[7] කාව්‍යයෙහි සමාරම්භය ඓතිහාසිකව ශාස්ත්‍රීය වශයෙන් අධ්‍යයනය

කරන විට පෙනී යන්නේ එහි සම්භවය යථෝක්ත පරිදි දෙවියන්ට ආරෝපණය නොකිරීමට ආදි කාලීනයන් පවා ක්‍රියා කොට ඇති බව ය.

පෙර - අපර දෙදිග ශිෂ්ටාචාරයේ කාව්‍යය ප්‍රභවයට පත් ආකාරය ඓතිහාසිකව අධ්‍යයනය කළ හැකිය. කාව්‍යය, පෙරදිග දී භාරතීය ශිෂ්ටාචාරය ඔස්සේත් අපරදිග දී ග්‍රීක ශිෂ්ටාචාරය ඔස්සේත් දීර්ඝ කාලයක් මුළුල්ලේ සංවර්ධනය හා ව්‍යාප්ත වෙමින් මේ දක්වා ම විකාශය වන්නකි. මෙහි ලා භාරතීය ශිෂ්ටාචාරය ඔස්සේ විහිදී ගිය කාව්‍ය සම්ප්‍රදාය කෙරෙහි පමණක් අවධානය යොමු කරනු ලැබේ. කවි ගායනයෙහි සහ කවි බන්ධනයෙහි සිරිත ආර්යයන් ඉන්දියාවට සංක්‍රමණය වීමට පෙර සිට එනම්, ඔවුන් මධ්‍ය ආසියාවේ විසූ කාලයේ සිට දිගට ම පවත්වාගෙන පැමිණි බව පෙනේ. වෛදික සාහිත්‍යයේ සඳහන් සූක්ත හඳුනාගැනෙන්නේ වෛදික ආර්යන් අතර වූ දක්ෂ කවීන්ගේ නිර්මාණයන් වශයෙනි.[8] වෛදික යුගයට අයත් ඍග්, යජුර්, සාමන් හා අථර්වන් ආදි වේදයන්හි දක්නට ලැබෙන්නේ ද ගායනා කළ හැකි ස්වරූපයෙන් දැක්වෙන ශ්ලෝක වන නිසා කාව්‍යයෙහි සමාරම්භය කොතරම් ඈත අතීතයේ සිට පැවත එන්නේ ද යන්න නිශ්චිත වශයෙන් නිගමනය කිරීම අපහසු ය. එසේ ම වෛදික යුගයේ දී රජතුමාගේ බලපරාක්‍රමය සහ ජයශ්‍රීය අවධාරණය කිරීම පිණිස අවස්ථානුකූල ව සකසා ගත් පද්‍ය විශේෂයක් තිබූ බවත් ඒවා ගායනා කළ පිරිස සූතයන් හෙවත් වෛතාලිකයන් නමින් හඳුන්වා ඇත.[9] මේ ගාථා තාලයට කියනවිට වීණා වාදනයක් ද කරන ලදි. අශ්වලායන ගෘහ්‍ය සූත්‍රයෙහි සඳහන් පරිදි මේ ගාථා නාරාශංසි ගාථා හෙවත් වීරස්වභාවය වර්ණනා කරන ගාථා යන නමින් හැඳින්විණ. **ඍග්වේදයට** ඇතුළු වූ දානස්තුති හෙවත් දානපතියාට ස්තුති කරන ගී මෙහි ලා සැලකිය යුතු ය.[10]

පෙරදිග කාව්‍ය මාර්ගයෙහි ආදි කර්තෘත්වය රාමායණ කර්තෘවර වාල්මීකිට හිමි වේ.[11] **රාමායණය** සංස්කෘත කාව්‍යයෙහි (පෙරදිග කාව්‍ය සම්ප්‍රදායෙහි) ආරම්භක ලක්ෂණ නිරූපණය කරන (රාමායණං ආදි කාව්‍යම්) වීරකාව්‍යය වශයෙන් ද පිළිගනී.[12] වාල්මීකි මුනිවරයා ජලස්නානය සඳහා තමසා නදී තීරයට සවස් කාලයේ ගමන් කරනවිට වැද්දෙක් අත්තක පෙම්සුව විඳින කුරුළු ජෝඩුවේ කුරුල්ලාට හීයකින් විද බිම දමා මරා දැමුවේ ය. මුනිවරයාගේ සිතේ හදිසියේ හටගත් වේදනාව පදනම් කරගෙන මුනිවරයාගේ මුවින්

නිරායාසයෙන් ''නිශාදය, කාමයෙන් මෝහනය වී සිටියා වූ කොස්වා ලිහිණියන් දෙදෙනාගෙන් එකෙකු ඔබ විසින් මරනු ලැබුවේ ද එහෙයින් ඔබට කිසිකලෙකත් සැනසීමක් නොලැබේවා'' යන අර්ථය හැඟවෙන පහත පද්‍යය පහළ විය.

මා නිශාද ප්‍රතිෂ්ඨාං ත්වං - අගමඃ ශාශ්වතී සමඃ

යත් ක්‍රෞඤ්චමිථුනාදේකං - අවධීඃ කාමමෝහිතම්[13]

කුරුල්ලාගේ වේදනාව කිරිල්ලියගේ වැලපීම දුටු මුනිවරයාගේ මුවින් ආකාස්මිකව ගලා ගෙන ගිය මෙම පද්‍යය පෙරදිග කාව්‍ය සම්ප්‍රදායෙහි සමාරම්භය වශයෙන් සැලකේ. කාව්‍යයෙහි සමාරම්භය පිළිබඳ ව විවිධ කාව්‍ය රචකයන් අතර හා කාව්‍ය ගුරුකුල අතර දිගු කලක් මුළුල්ලේ පැනනැගුණු විවිධ නිර්වචන, අර්ථ විවරණ සහ මතිමතාන්තර ඇතත් ඒවායින් කවරක් වඩා උචිත දැයි නිශ්චය වී නොමැති තරම් ය. කෙසේවෙතත් සංවිධානාත්මක කාව්‍යයෙහි සහ කාව්‍ය ශාස්ත්‍රයේ සමාරම්භය පිළිබඳ ව මතවාද දෙකක් පවතී. පෙරදිග සංවිධානාත්මක කාව්‍ය ශික්ෂණයේ ආදි කර්තෘත්වය **නාට්‍යශාස්ත්‍රය** රචනා කළ භරතමුනිවරයාට[14] හිමි වේ. වෘද්ධ භරත හෝ ආදි භරත සහ භරත යනුවෙන් භරතවරුන් දෙදෙනෙකු සංස්කෘත සාහිත්‍යයෙහි දැක්වේ. ද්වාදසසාහස්‍රී කෘතිය වෘද්ධ භරතගේ නිර්මාණයකි. කෙසේවෙතත් **භරතමුනිගේ නාට්‍යශාස්ත්‍රය චාන්ද්‍ර ව්‍යාකරණයෙහි** සහ යාස්කගේ නිරුක්ති සාධනයෙහි උද්ධෘත දැක්වෙන බැවින් ආදිතම යැයි පිළිගැනේ.[15] භරතමුනිවරයා විසින් විරචිත **නාට්‍යශාස්ත්‍ර**, සංස්කෘත සාහිත්‍ය විවේචනය පිළිබඳ ව දැනට විද්‍යමාන පැරණිත ම කෘතිය වෙයි.[16] එහෙත් මෙයට පෙර ද කාව්‍යවිචාර ශාස්ත්‍රය භාරතයේ තිබුණු බව නාමශේෂී ග්‍රන්ථවලින් පැහැදිලි වේ. ඒ අතර නන්දිකේශ්වරගේ **රසප්‍රකරණය ස්වර්ණනාභගේ** රීති යන කෘති වැදගත් වේ. එමෙන් ම කාශ්‍යපමුනි, වරරුචි සහ මේධාවින් යන කර්තෘවරු ද ප්‍රධාන වේ.[17] **නාට්‍යශාස්ත්‍ර** රචනා වී ඇත්තේ කාව්‍යයේ සජීවී අංගයක් වන නාට්‍ය හෙවත් දෘෂ්‍ය කාව්‍ය මුල්කරගෙන ය. භරතමුනි විසින් කෙරුණු **නාට්‍යශාස්ත්‍රය** දෘශ්‍ය කාව්‍යයේ ගුණ දෝෂ විවේචනය පදනම් කොටගෙන භාරතීය කාව්‍යවිචාරය සම්භව වී ඇත. නාට්‍යයක් ප්‍රේක්ෂකයා හමුවට ගෙනයනු ලබන්නේ එහි ඇති චතුර්විධ අභිනය මඟිනි.

1. වාචික අභිනය
2. ආංගික අභිනය
3. සාත්වික අභිනය
4. ආහාර්ය අභිනය

නාට්‍යයේ ඇති දෙබස් සහ කතා කරන වචන වාචික අභිනයට අයත් වේ. සංස්කෘත නාට්‍යවල මෙම වාචික අභිනය සඳහා ගද්‍ය පද්‍ය (ශ්ලෝක) ආදිය යොදා ගනී. මෙම ගද්‍ය පද්‍ය ප්‍රවර්ග දෙක ම කාව්‍යය සේ ගණනය කෙරේ. එහෙත් කාව්‍ය විචාරකයන් නාට්‍යයේ වාචික අභිනය සැලකුවේ නාට්‍ය ක්ෂේත්‍රයට පමණක් අයත් වන්නක් වශයෙනි.[18] නාට්‍යන්හි ඇතුළත් ගද්‍ය පද්‍යවල ගුණ දෝෂ ඉදිරිපත් කෙරෙන නාට්‍යශාස්ත්‍රය නාට්‍යයට ම පමණක් නොව පොදු ගද්‍ය හා පද්‍ය කාව්‍යවලට ද සම්බන්ධ කළ හැකි ය. භාරතීය කාව්‍යවිචාරයේ සම්භවය **නාට්‍යශාස්ත්‍රය** ඇසුරින් සොයා බැලෙන්නේ භාරතීය කාව්‍යවිචාර කලාවේ ප්‍රධාන කාව්‍යවිචාර දර්ශනයක් වන රසවාදයෙහි ආරම්භය නාට්‍යශාස්ත්‍රයෙහි දක්නට ඇති නිසා ය.

**ඍග්, යජුර්, සාමන් හා අථර්වන්** ආදි වෛදික සාහිත්‍යය සහ **රාමායණය මහාභාරතය** ආදි වීරකාව්‍ය සාහිත්‍යයේ භාරතීය කාව්‍ය සම්ප්‍රදායෙහි ප්‍රභවස්ථාන නිරීක්ෂණය වුව ද රසවාදය වැනි ශික්ෂිත සහ සංවිධානාත්මක ව කාව්‍ය ක්‍රමෝපායයන් ඉදිරිපත් වූ දියුණු අවස්ථාව ක්‍රි.ව. දෙවන සියවසේ භරතමුනිගේ **නාට්‍යශාස්ත්‍රයෙන්** ඉදිරිපත් වේ.

**කාව්‍යය සමාරම්භය : බෞද්ධ මතය**

පෙරදිග කාව්‍ය සංකල්පයෙහි සමාරම්භය වෛදික සහ වීරකාව්‍ය සාහිත්‍යයන් තුළ නිරීක්ෂණය වන බව බහුසම්භාවිත මතය වුවත් පාලි පිටකාගත සූත්‍ර දේශනාවල ද පෙරදිග කාව්‍ය සංකල්පයෙහි සමාරම්භක අවස්ථා කිහිපයක් නිරීක්ෂණය කරගත හැකි ය. කාව්‍ය නිර්මාණකරුවෙකු කාව්‍යාත්මක මෙවලම් යොදා උසස් කාව්‍යයක් නිර්මාණය කරන්නාක් මෙන් කාව්‍ය නිර්මාණය කිරීම සම්බුදුවරයෙකුට අයත් කටයුත්තක් නොවුණ ද උන් වහන්සේගේ සූත්‍ර දේශනාවල නිරායාසයෙන් ජනිත වූ කාව්‍යයන්හි බොහෝ ප්‍රාරම්භක අවස්ථාවන්

දක්නට ලැබේ. **ඍග්වේද ගීතවලත්** ත්‍රිපිටකයෙහි **උදාන හා ථේර-ථේරී ගාථාවලත්**, දක්නට ලැබෙන්නේ එක ම ආකාරයේ අව්‍යාජ නිදහස් කාව්‍ය උක්තීන් ය. නිසර්ගයෙන් ම මෙන් ඒවාට කාව්‍යමය ලක්ෂණ ඇතුළු වූවා විය හැකි ය.[19] පිටකාගත බොහොමයක් සූත්‍ර දේශනාවන් රසාලිප්ත සෞන්දර්යාත්මක දේශනාවන්ගෙන් සමලංකෘත ය. ලෞකික සුන්දරත්වයෙන් අලෞකික චමත්කාරය දක්වා පුද්ගලයා මෙහෙය වන මනරම් දේශනා සමූහයක් වශයෙන් පාලි සූත්‍ර දේශනා හඳුනාගත හැකි ය.

බෝසතුන් සම්බුද්ධත්වයට පත් වීමෙන් අනතුරු ව සම්බුදුරදුන් සේ දේශනා කළ පළමු උදාන[20] වාක්‍යයෙන් ම ප්‍රකට වන්නේ බුදුසමයේ සමාරම්භයේ දී ම ධර්ම සන්නිවේදනය උදෙසා කාව්‍ය උක්ති භාවිත වූ බව යි. බුදුරදුන්ට බුද්ධත්වය ලැබුණු බැව් අපමණ සන්තුෂ්ටියෙන් යුතු ව ලෝකයාට ප්‍රකාශ කෙරෙන පළමු උදාන වාක්‍යය රසභාව සංයුක්ත කාව්‍ය නිර්මාණයක් බවට පත්ව ඇත්තේ ය.[21] කාව්‍ය සංකල්පයෙහි සාරය සහ මුඛ්‍ය පරමාර්ථය වන්නේ ආනන්දයෙන් ප්‍රඥාව කරා පුද්ගලයා මෙහෙය වීම යි. මේ අනුව ආනන්දයෙන් ආරම්භ වී ප්‍රඥාවෙන් කූටප්‍රාප්ත වන බොහෝ උසස් කාව්‍යෝක්තීන් රැසක් පාලි පිටකාගත සූත්‍ර දේශනාවල දක්නට ලැබේ. සාහිත්‍යමය සහ කාව්‍යමය පක්ෂයෙන් වඩාත් සාරවත් ම බෞද්ධ කෘති බහුල ව දක්නට ලැබෙන්නේ සූත්‍ර පිටකය තුළ ය. **සුත්තනිපාතය, ධම්මපදය, ජාතක, අපදාන, ථෙරගාථා-ථෙරීගාථා** ඒ අතර ප්‍රධාන වේ. මෙලෙස කාව්‍යය ආකෘතියට බෙහෙවින් සමාන වූ බොහෝ සූත්‍ර දේශනා පාලි පිටකාගත සූත්‍ර සාහිත්‍යයේ දක්නට ලැබේ. සිහිල් දියදහර ගලා යන වන රොදවල සිව්පාවන්, පක්ෂීන් සමග එකට ජීවත් වූ තෙර තෙරණින් විසින් අත්විඳි කායික මානසික සුවය පිළිබඳ අත්දැකීම් කාව්‍ය උක්තීන් බවට පත් වූ අයුරු එම කෘතිවල ඇති පද්‍යවලින් නිරූපණය වේ. උසස් කාව්‍යයක් හඳුනාගෙන එය ප්‍රවර්ග කිරීම හා එය අගය කිරීම පිළිබඳ ව කාව්‍යවිචාරාත්මක දැනුමක් සහ අවබෝධයක් බුද්ධ කාලයේ දී පැවති බව ද **අංගුත්තරනිකායේ** කවි සූත්‍රය ඇසුරින් ප්‍රකට වේ. චින්තා කවි, සුත කවි, අත්ථ කවි, පටිභාන කවි[22] යනුවෙන් කවියන් සිව්දෙනෙකු තත්කාලීන බුද්ධ කාලීන භාරතීය සමාජයේ සිටි බවත් එකල විවිධ කවීන් අතර උසස් තැනක් මේ කවීන්ට ලැබුණු බවත් එයින් ප්‍රකට වේ.

**ඛුද්දකනිකායේ ථෙරගාථාපාළියෙහි** වංගීස ථෙරගාථාවේ දී වඞ්ගීස තෙරුන් "කාවෙය්‍ය මත්තා විචරිම්හ පුබ්බෙ ගාමාගාමං පුරාපුරං"[23] (අපි පෙර කවිකාරයන් වශයෙන් ගමින් ගමට පුරයෙන් පුරයට ගියෝ වෙමු) ආදි වශයෙන් දක්වා ඇති ප්‍රවෘත්තියෙන් පැහැදිලි වන්නේ වඞ්ගීස හිමියන් ගමින් ගමට නගරයෙන් නගරයට ගමන් කරන කවි කණ්ඩායමකින් පැවත ගෙන එන්නෙක් බව යි. කවි ගායනය හා කවි බන්ධනය ජීවිකා වෘත්තිය කරගත් පිරිස හිටිවන කවියන්, කවිකාර මඬුව හෝ වන්දිභට්ට යන නමින් හැඳින්වේ. මෙය බුද්ධ කාලීනව මහජනතාව සතුටු කරන ජනප්‍රිය ජීවිකා වෘත්තියක්ව පවතින්නට ඇත. ඊට අමතර ව මහජනයා සීසෑම ආදි ලකීරක්ෂා කරන ස්ථානවලට ගොස් මහන්සි වී සිටින අයට විනෝදය සපයා කෑමබීම, මිලමුදල්, තෑගි ආදිය බලාපොරොත්තුවෙන් ද කවි කියන්නට ඇත. මේ අදහස **සුත්තනිපාතයේ** කසීභාරද්වාජ සූත්‍රයෙන් ප්‍රකට වේ.

ගාථාභිගීතං මෙ අභොජනෙය්‍යං - සම්පස්සතං බ්‍රාහ්මණ නෙස ධම්මො

ගාථාභිගීතං පනුදන්ති බුද්ධා - ධම්මෙ සති බ්‍රාහ්මණ වුත්තිරෙසා[24]

(බ්‍රාහ්මණය ගී ගැයුමින් ලත් පායාසය මා විසින් වළඳනට නොනිසියේය. සම්‍යග්පාරිශුද්ධිය දක්නා බුදුවරයෙකුට එය චාරිත්‍ර ධර්ම නොවේ. සර්වඥයෝ ගී ගැයුමින් ලත් ආහාරය පිළිකෙව් කෙරෙති.)

අනාගතයෙහි දී ගැඹුරු වූ අරුත් ඇති ශ්‍රී සද්ධර්මයෙහි අතුරුදහන්වීම පිළිබඳ ව බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කරති.

"බුද්ධශ්‍රාවකයෝ මතු කාලයක දී ගැඹුරු වූ අරුත් ඇති ලොව්තුරු අරුත් දනවන ශූන්‍යතා ධර්මය පවසන කෙනෙක් වේද ඔවුන් දේශනා කරන කල්හි එය ඇසීමට කැමැති නොවන්නාහ. කන් යොමු නොකරන්නාහ. අවබෝධය පිණිස සිත නො එළවන්නාහ. ඒ දහම් උගත යුතු යැයි ප්‍රගුණ කළ යුතු යැයි නොසිතන්නාහ. කවීන් විසින් කරන ලද කවීන් විසින් නිපදවන ලද විසිතුරු අකුරු ඇති විසිතුරු ව්‍යඤ්ජන ඇති සසුනෙන් බාහිර අන්‍ය සව්වන් විසින් කියන ලද යමක් වේද ඔවුන් ඒවා කියනු ලබන කල්හි එය ඇසීමට කැමැති

වන්නාහ. කන් යොමු කරන්නාහ. අවබෝධය පිණිස සිත එළවන්නාහ. ඒවා උගත යුතු යැයි ප්‍රගුණ කළ යුතු යැයි සිතන්නාහ. මෙසේ ගැඹුරු වූ අරුත් ඇති ලොව්තුරු අරුත් දැක්වෙන ශ්‍රී සද්ධර්මයෙහි අතුරුදහන්වීම වන්නේය."[25] යනුවෙනි.

බුදුරදුන්ගේ ඇවෑමෙන් බුද්ධ ශ්‍රාවකයන්, කවීන් විසින් කරන ලද කවීන් විසින් නිපදවන ලද විසිතුරු අකුරු ඇති විසිතුරු ව්‍යඤ්ජන ඇති සසුනෙන් බාහිර වූ කාව්‍යයන් ප්‍රිය කරන බවත් බුද්ධ භාෂිතයට ප්‍රිය නොකරන බවත් මින් කියැවෙයි. මෙම අදහස **සංයුත්ත** හා **අංගුත්තර දෙනිකායෙහි** ම දැක්වෙන අනාගත භය සූත්‍ර දේශනාවල දී ද දැක් වේ. **දීඝනිකායේ** සීලක්ඛන්ධ වග්ගයේ සූත්‍රවල මධ්‍යම සීලය යටතේ භික්ෂූන්ට තහනම් කොට ඇති ජීවනෝපායන් අතර "කාවෙය්‍යං" යන්න දක්නට ලැබේ.[26] එයින් ප්‍රකට වන්නේ භික්ෂූන් වහන්සේලා ජීවත්වීම සඳහා කාව්‍ය රචනා කිරීම විරමණය කළ යුතු ධර්මයක් බව යි.

**නිගමනය**

මානවයාගේ ආදිතම ඉතිහාසයේ සිට අද දක්වා ම නොනැසී පවතින සෞන්දර්යාත්මක සහ නිර්මාණාත්මක චින්තනමය ක්‍රියාවලියේ පාරප්‍රාප්තිය කවිය සේ ගිණිය හැකි ය. කවියේ ප්‍රාරම්භය දෙවියන් වෙතින් වූ බව සාම්ප්‍රදායික ව පිළිගැණුන ද පෙර අපර දෙදිග කාව්‍යවිචාරකයන් එය ආදිකාලීන ගැමියන්ට යොමු කර ඇත. දන මන පොබයන කවිසමයානුගත කාව්‍ය උපාංගයන්ගෙන් සැරසුණු මනරම් කවි නිමවීම සම්බුදුවරයෙකුගේ කාර්යය නොවුව ද උන්වහන්සේගේ දේශනාවල බොහෝ රමණීය කාව්‍ය චින්තාවන් ද ඇතුළත් බව ප්‍රකට ය. බුද්ධ දේශනාවන්ගේ වඩාත් ම විශ්වාසනීය මූලාශ්‍රය පාලි බසින් ලියැවී ඇති ත්‍රිපිටකය යි. ත්‍රිපිටක මූලාශ්‍රය අතර සාහිත්‍යමය හා කාව්‍යමය අංශයෙන් වඩාත් සාරවත් බෞද්ධ කෘති වෙසෙසින් ම සූත්‍ර පිටකයෙහි විද්‍යමාන වේ.

කාව්‍ය සංකල්පය පිළිබඳ පාලි පිටකාගත සූත්‍ර සාහිත්‍යයෙන් හමුවන උක්ත කරුණුවලින් පැහැදිලි වන්නේ බුද්ධ කාලය වන විට උසස් කවියන් සිටි බවත් එකල කාව්‍යකරණය ජනප්‍රිය ජීවන වෘත්තියක් වශයෙන් තිබූ බවත් ය. එවැනි කවීන් විසින් ඉතා උසස්

අව්‍යාජ කාව්‍ය ආකෘතීන්ගෙන් සැකසුණු බෞද්ධ කාව්‍ය පාලි පිටක සාහිත්‍යයේ දිස්වන බැවින් පෙරදිග කාව්‍ය සංකල්පයේ ප්‍රභවය පිළිබඳ සාධක පාලි පිටකාගත සූත්‍ර සාහිත්‍යයේ ද ඇතුළත් වේ. මේ අනුව පෙරදිග කාව්‍ය සංකල්පයෙහි ප්‍රභවය භාරතීය සංස්කෘත කාව්‍ය සම්ප්‍රදායේ පමණක් නො ව පාලි පිටකාගත සූත්‍ර දේශනාවන්වල ද අන්වේෂණය කළ යුත්තක් වේ.

## ආන්තික සටහන්

01. **පාලි සිංහල අකාරාදිය**, 2001, බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල: 185 පිටුව.

02. ''සකල ප්‍රයෝජන මෞලිභූතං සමන්තරමෙව රසාස්වාදය සමුද්භූතං විහලික වෙද්‍යාන්තර මානන්දං ප්‍රභුසංචිත ශබ්ද ප්‍රධාන වේදාදි ශාත්‍රෙභ්‍යඃ සුහෘත්සංචිත'' (කාව්‍ය ප්‍රකාශය) රේවත හිමි, උඩවෙල, 2010, **සකු කවි ලකුණු**, සමයවර්ධන, කොළඹ: 10 පිටුව.

03. එම

04. ''කාව්‍යං රසාත්මකං වාක්‍යං'' - විශ්වනාථ., (කාව්‍ය ප්‍රකාශය), රේවත හිමි, උඩවෙල, 2010, **සකු කවි ලකුණු**, සමයවර්ධන, කොළඹ: 10 පිටුව.

05. **''ශබ්දාර්ථෞ සාහිත්‍යෞ කාව්‍යයම්''** - භාමහ., (කාව්‍ය ප්‍රකාශය), රේවත හිමි, උඩවෙල, එම.

06. තිලකසිරි, ජයදේව, 2007, **සංස්කෘත කාව්‍ය සාහිත්‍යය** (දෙවන මුද්‍රණය), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ: 12 පිටුව.

07. වික්‍රමසිංහ, මාර්ටින්, 1991, **ථේරී ගී සහ කාව්‍යවිචාරය**, සී/ස තිසර පොත් ප්‍රකාශකයෝ, දෙහිවල: 97 පිටුව.

08. චන්දරතන හිමි, ලබුහේන්ගොඩ, 1964, "පාලි සාහිත්‍යයේ එන කවියන් පිළිබඳ ව සටහන් හා ථෙරගාථාවන්ගෙන් හෙළිවන කවිත්වය", ලේඛන සිඛා, සංස් - වල්පොල විමලඥාණ හිමි, බෙල්ලන්විල විමලරතන හිමි, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය: 22 - 29 පිටු.

09. තිලකසිරි, ජයදේව, 1971, **වෛදික සාහිත්‍යය**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ: 05 පිටුව.

10. එම

11. The Indian Tradition Makes Vālmīki the Author of the Rāmayana….., Sastri, Gaurinath, 1943, **A Consise History of Classical Sanskrit Literature**, Calcutta, 48 p.

12. තිලකසිරි, ජයදේව, **සංස්කෘත කාව්‍ය සාහිත්‍යය**, 25 පිටුව.

13. **රාමායණය**, 02, 15 ශ්ලෝකය, රේවත හිමි, උඩවෙල, 2010, සකු කවි ලකුණු, සමයවර්ධන, කොළඹ, 11 පිටුව.

14. තිලකසිරි, ජයදේව, 2000, 25 පිටුව.

15. "The name of Bharatha appears in two forms Vruddha bharatha or ādhibharatha and Bharatha. Dvādasasāhari is likely the work of Vruddha bharatha… Nātyasāstraya is a very ancient work. It quotes from Aindravyākaranaya and Yāska…'' Nātyasāstraya, 1981,.ed.- Nagar, R.S., Parimal, New Delhi, 810 pp.

16. රත්නායක, මනෝජ්, ප්‍රසාත්, 2012, **සංස්කෘත කාව්‍යවිචාරය**, සරසවි ක්‍රියේෂන්, 20 පිටුව.

17. එම, 16 පිටුව.

18. රත්නායක, මනෝජ්, 2012, 17 පිටුව.

19. චන්දරතන හිමි, ලබුහේන්ගොඩ, 1964, 22 - 29 පිටු.

20. "අනෙකජාති සංසාරං සන්ධාවිසසං අනිබිසසං
ගහකාරකං ගවෙසනෙතා දුක්ඛා ජාති පුනපපුනං
ගහකාරක දිටෙඨාසි පුනගෙහං න කාහසි
සබබා තෙ ඵාසුකා භගගා ගහකූටං විසංකිතං
විසංකාරගතං චිතතං තණ්හානං ඛයමජ ඣගා", ධ. ප., ජරාවග්ග, 8-9 ගාථා.

21. අබේසිංහ, ඒ. ඩබ්ලිව්, 2018, **කාව්‍යය සහ ගීතය පිළිබඳ ව බෞද්ධ ආකල්පය**, පඤ්ඤාසෝමාභිනන්දන, සංස්- අලහේනේගම සුමනරතන හිමි, ශ්‍රී පුෂ්පාරාම පුරාණ විහාරය, නාත්තණ්ඩිය, 254-263 පිටු.

22. චත්තාරො භික්ඛවෙ කවී කතමෙ චත තාරො චින තාකවි සුතකවි අත්ථකවි පටිභානකවි ඉමෙ ඛො භික්ඛවෙ චත තාරො කවි..., අ.නි., චතුක්ක නිපාතය, බු.ජ.ත්‍රි.මු., කවි සූත්‍රය.

23. **ථෙර.**, 2013, මහානිපාත, බු.ජ.ත්‍රි.මු., වඞ්ගීස ථෙරගාථා, 340 පිටුව.

24. **සු.නි.**, උරග වග්ගය, බු.ජ.ත්‍රි.මු., කසීභාරද්වාජ සූත්‍රය, 442 පිටුව.

25. එවමෙව බො භිකඛවෙ භවිසසනති භිකඛූ අනාගත මදධානං යෙ පන සුතතනතා තථාගත භාසිතා ගමභීරා ගමභීරතථා ලොකුතතරං සුඤඤතපටිසංයුතතා තෙසු භඤඤමානෙසු න සුසසුසිසසනති න සොතං ඔදහිසසනති, න අඤඤචිතතං උපටඨාපෙසසනති. න ච තෙ **ධමෙම උගගහෙතබබං** පරියාපුණිතබබං මඤඤිසසනති. යෙ පන සුතතනතා කවිකතා කාවෙයයා චිතතකඛරා චිතතබයඤජනා බාහිරකා සාවක භාසිතා තෙසු **භඤඤමානෙසු** සුසසුසිසසනති. සොතං ඔදහිසසනති අඤඤචිතතං **උපටඨාපෙසසනති** තෙ ච ධමෙම **උගගහෙතබබං පරියාපුණිතබබං** මඤඤිසසනති. එවමෙතෙසං භිකඛවෙ **සුතතනතානං** තථාගතභාසිතානං ගමභීරානං ගමභීරතථානං ලොකුතතුරානං **සුඤඤතපටිසංයුතතානං** අනතරධානං භවිසසති.,, ස.නි., නිදාන වග්ගය, ඔපම සංයුත්තය, ආණි සූත්‍රය, බු. ජ. ත්‍රි. මු., 413 පිටුව.

26. භද්දිය හිමි, පොද්දල්ගොඩ, 2019, **සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ ව බෞද්ධ ආකල්පය**, සංධාරා, සංස්- මන්දාරම්නුවර සුගුණධම්ම හිමි, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම, 270-285 පිටු.